# වන පළතුර

# හොටේබෙ





මල් කිනිති ලෙස සකස්වන අතර සමහර කිනිති ශාඛනය විමක්ද දක්වයි. මල් කිනිත්තක් සෙන්ටිමීටර් 6 - 12 විතර දිගැටි වන අතර මල් කහ පැහැයට හුරු සුදු පැහැයක් ගනී. ගෙඩි ගෝලාකාර වන අතර ගම්මිරිස් කිනිත්තක් මෙන් නටුවට සම්බන්ද වී සකස් වි ඇත. ගෙඩියක් සෙන්ටිමීටර් 0.5 විතර විෂ්කම්භයකින් යුක්තය. ගෙඩි මුල් කාලයේ කොළ පැහැති වන අතර ඉදුණු පසු තැඹිලි/ රතු වර්ණයක් ගනී. ගෙඩියක් තුළ ගෝලාකාර එක් බීජයක් ඇත.

මෙම ගසෙහි පොතු, කොළ, මුල් ආදිය දේශිය ආයුර්වේද විද්‍යාවේදි ඖෂධ ලෙස යොදාගනී. කොළ යුෂ මුඛ සෝදන දියර ලෙසද, සමෙහි ඇති වන පලු හා තුවාල මෙන්ම කැසීම් සඳහාද යොදාගනී. මෙහි මුල් අතිසාරය සඳහා ද, පොතු පිලිස්සුම් හා අස්ථි හග්න සඳහා ද විශේෂයෙන් යොදාගනී. උණ හා බඩේ අමාරු සුව කිරිමේ හැකියාවක් ඇත. මෙම ගසෙහි ගෙඩි වනගත පලතුරක් ලෙස ද යොදාගනී. එම ගෙඩි වල මද කහට රසයට හුරු පැණි රසක් ඇත. ඇටය වටා ඇති මාංශල කොටස ආහාරයට ගෙන ඇටය ඉවත් කරනු ලැබේ. ආහාරයට ගත හැක්කේ හොඳින් ඉදුණු ගෙඩි වන අතර අමුවෙන් ආහාරයට ගත නොහැකිය. මෙම පලතුරෙහි ක්ෂුද්‍ර පෝෂක හා ප්‍රතිඔක්ෂිකාරක බහුල බැවින් පිළිකා වැනි රෝග අඩු කිරිමේ හැකියාවක් ඇත. අතීතයේදි මිනිසුන් මේවා ආහාරයට ගත්තද අද මිනිසුන් මෙම ගසේ නමවත් නොදන්නා බව පැහැදිලි කරුණකි. අපේ රටේ ඇති මෙවැනි අනගි වනගත පළතුරු අප අතරින් ගිලිහෙන්නට නොදි රැකගැනුම ඔබ අපගේ යුතුකම නොවන්නේද ?

සටහන
*වී. පී. පී අරුණ යසපාලිත,*
*කෘෂිකර්ම උපදේශක, සේවාගම, පොළොන්නරුව.*